# ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
# කොළඹ

## පුවත්පත් නිවේදනය

## <u>සීගිරි පර්වතයේ සිංහපාදය අසල RO ජල සම්පාදන පද්ධතිය විවෘත කිරීම</u>

ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා 2024 අගෝස්තු 21 වන දින යුනෙස්කෝ ලෝක උරුමයක් වන සීගිරි බලකොටුවේ සිංහපාදය අසල RO ජල සම්පාදන පද්ධතිය විවෘත කළේය. මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජෙනරාල්තුමා, මධ්‍යම පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්තුමා, මධ්‍යම පළාත් වෙළඳ, වාණිජ සහ සංචාරක දෙපාර්තමේන්තුවේ නියෝජිතයන් ඇතුළු රාජ්‍ය නිලධාරීන් රැසක් එම අවස්ථාවට සහභාගී වූහ.

2. RO ජල සම්පාදන පද්ධතිය බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ පවතින මධ්‍යම සංස්කෘතික අරමුදල වෙත භාර දී තිබිණ. ඉන්දීය රජය ඉදිරි වසර පහ තුළ මෙහි නඩත්තු පිරිවැය දරනු ඇත.

3. RO ජල සම්පාදන පද්ධතිය සීගිරිය නැරඹීමට ලොව නන් දෙසින් පැමිණෙන සංචාරකයන්ගේ පිපාසය සංසිඳුවාලනු ඇත. මෙම සහයෝගය ශ්‍රී ලංකාවේ විවිධ ක්ෂේත්‍රවල වර්ධනය සහ ප්‍රගතිය උදෙසා ඉන්දියාවේ කැපවීම අවධාරණය කරයි.

***

කොළඹ
2024 අගෝස්තු 22